# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1655/4 - 2010 මැයි 24 වැනි සඳුදා - 2010.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අබ්දුල් වාහිඩ් ඉරයිමා ලෙබ්බේ නම් වූ සභිකයා අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන මොහමඩ් ඉබ්‍රාහිම් සිද්දීක් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී තුරයිසිංගම් ක්‍රිෂ්ණානන්දලිංගම් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මොහමඩ් ඉබ්‍රාහිම් සිද්දීක් මහතා එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ටී. ක්‍රිෂ්ණානන්දලිංගම්,
තේරීම්භාර නිලධාරී,
එරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 05 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

06-149

1A - G 12878— 380 (2010/5)

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

### ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන රොසාන් පෙරේරා මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අබ්දුල් ඔෆූර් මොහොමඩ් නෆීල් වන මම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10 අ(1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ඒ. ඕ. එම්. නෆීල්,
තේරීම්භාර නිලධාරී,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 05 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

06-150

---

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

### හලාවත ප්‍රාදේශීය සභාව

හලාවත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන රන්කොත්පේඩිගේ ජයවීර වික්‍රමරත්න මහතා, එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව හලාවත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අබ්දුල් ඔෆූර් මොහොමඩ් නෆීල් වන මම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10 අ(1) (අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

ඒ. ඕ. එම්. නෆීල්,
තේරීම්භාර නිලධාරී,
හලාවත ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 10 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

06-151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.